ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2020/03/23 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය 2020 පෙබරවාරි මාසයේ දී ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 8.1%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.5%
- මාසික වෙනස : 0.0%

**මූලික උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 3.4%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.5%
- මාසික වෙනස : 0.4%







ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 ජනවාරි මාසයේ පැවති සියයට 7.6හි සිට 2020 පෙබරවාරි මාසයේ දී සියයට 8.1 දක්වා ඉහළ යන ලදී. 2019 පෙබරවාරි මාසයේ පැවති පහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා දායක විය. තවද, ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2020 පෙබරවාරි මාසයේ දී සියයට 16.3හි පැවති අතර, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 2.1හි පැවතුණි.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2020 ජනවාරි මාසයේ පැවති සියයට 4.1හි සිට 2020 පෙබරවාරි මාසයේ දී සියයට 4.5 දක්වා ඉහළ ගියේය.

2020 පෙබරවාරි මාසයේ දී ජා.පා.මි.දර්ශකයෙහි මාසික වෙනස සියයට 0.0ක් ලෙස වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිලෙහි සිදු වූ සියයට 0.05ක මාසික ඉහළ යෑම, ආහාර

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

කාණ්ඩයේ අයිතමවල ඒ හා සමාන ප්‍රමාණයකින් සිදු වූ මිල පහළ යෑම මගින් තුලනය වීම මේ සඳහා හේතුවිය. 2020 පෙබරවාරි මාසයේ දී ආහාර කාණ්ඩයෙහි එළවළු සහ සහල් මිල ගණන්වල පහළ යෑමක් වාර්තා වූ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි මද්‍යසාර පාන වර්ග සහ දුම්කොළ; ප්‍රවාහන; සහ රෙදිපිළි සහ පාවහන් උප කාණ්ඩයන්හි අයිතමවල මිල ඉහළ යෑම් වාර්තා විය.

ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව සිව්වන මාසය තුළදී ද පෙන්නුම් කරමින්, 2020 ජනවාරි මාසයේ දී පැවති සියයට 3.9හි සිට 2020 පෙබරවාරි මාසයේ දී සියයට 3.4 දක්වා පහළ යන ලදී. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 ජනවාරි මාසයේ දී පැවති සියයට 5.6හි සිට 2020 පෙබරවාරි මාසයේ දී සියයට 5.5 දක්වා සුළු වශයෙන් පහළ යන ලදී.

## දත්ත ඇමුණුම

### සංඛ්‍යා සටහන 1 : ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |
| 2020 | ජනවාරි | 137.0 | 135.3 | 1.5 | 0.8 | 7.6 | 3.9 | 4.1 | 5.6 |
| | පෙබරවාරි | 137.0 | 135.8 | 0.0 | 0.4 | 8.1 | 3.4 | 4.5 | 5.5 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව